පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

පළමු වසර (100) පරීක්ෂණය (බාහිර නව විෂය නිර්දේශය) - 2018 අගෝස්තු

මානව භූගෝලවිද්‍යාව **(GGYE 101)**

පළමු ප්‍රශ්ණයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. ඊට අමතරව තවත් ප්‍රශ්ණ තුනක් තෝරාගන ප්‍රශ්ණ හතරකට **(04)** ට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්ණ පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්ණ සංඛ්‍යාව අටකි 0(8). දළ ලෝක සිතියම් දෙකක් මේ සමග සපයා ඇත. ජංගම දුරකථන විභාගය සඳහා භාවිතා කිරීම තහනම් බව සලකන්න.

කාලය: පැය තුනයි

(1) පහත සඳහන් ස්ථාන දෙන ලද ලෝක සිතියමෙහි ලකුණුකොට නම් කරන්න — ලකුණු 2.5x10=25

- අ. ජර්මනිය සහ ආර්ජන්ටිනාව
- ආ. රියෝ ඩි ජෙනෙයිරෝ නගරය
- ඇ. ඉන්දු නිම්නය
- ඈ. රෝම නගරය
- ඉ. මක්කම සහ ලුම්බිනිය
- ඊ. යටත් විජිත අයිතිව සිටි යුරෝපීය රටවල් හතරක්
- උ. නව කාර්මික රටවල් දෙකක්
- ඌ. තේ වගාකරන රටවල් දෙකක්
- එ. මානව සංවර්ධනය අතින් ඉහල රටවල් දෙකක්
- ඒ. ගෝලීය නගරයක්

(2) "මානව භූගෝලවිද්‍යාවේ එන මිනිස් පරිසර සම්බන්ධතා ප්‍රවේශය මගින් වඩා යහපත් අනාගතයක් ඇතිකිරීමට දායකවිය හැකිය. මෙම කියමන පරීක්ෂා කරන්න. — ලකුණු 25

(3) (අ) මානව සංක්‍රමණය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? — ලකුණු 05

(ආ) දෙන ලද ලෝක සිතියමෙහි අතීත මානව සංක්‍රමණ රටාවන් ඇඳ දක්වන්න. — ලකුණු 05

(ඇ) අද්‍යතන ලෝකයේ සංක්‍රමණ රටාවන් ආසියානු මහද්වීපයට විශේෂ අවධානය දක්වමින් විස්තර කරන්න. — ලකුණු 15

(4) (අ) ගෝලීයකරණයෙහි ප්‍රධාන ස්වරූපයන් හතරක් නම්කරන්න — ලකුණු 04

(ආ) ගෝලීයකරණය පිළබඳව විශ්වාශයෙන් සහ සැකකටයුතු ආකාරයෙන් බලන කණ්ඩායම් වල අදහස් ඔබට වැටහෙන ආකාරයට පැහැදිලි කරන්න. — ලකුණු 06

(ඇ) ගෝලීයකරණයෙහි සමාන සම්බන්ධ කරුවන් වීම සඳහා ශ්‍රී ලංකාවේ යම් ව්‍යුහාත්මක වෙනස්කම් කිරීමට අවශ්‍යද? සුදුසු උදාහරණ ගෙනහැර දක්වමින් විස්තර කරන්න — ලකුණු 15

(5) (අ) ජනගහනය ඌනලෙස ව්‍යාප්ත වීමට බලපාන භෞතික සාධක විස්තර කරන්න. ලකුණු 10

(ආ) ජනගහනයට සම්බන්ධ කරුනු ලෝකයේ පාරිසරික ගැටලු සඳහා කෙසේ ඉවහල් වෙව්දැයි විවේචනාත්මකව අගය කරන්න. ලකුණු 15

(6) (අ) ජනගහන ප්‍රක්ශේපනයට අනුව 2021 දී ලංකාවේ වයසක ජන සංඛ්‍යාව මුලු ජනගහනයෙන් සියයට 25 ක් පමණ වනු ඇත. මෙමගින් ඇතිවිය හැකි ගැටලු දක්වන්න. ලකුණු 10

(ආ) ඉහතින් සඳහන් කරනලද ගැටලු විසඳීම සඳහා ඔබගේ යොජනා ලබාදෙන්න. ලකුණු 15

(7) (අ) නාගරික ප්‍රදේශයක් නිර්වචනය කිරීම සඳහා භාවිතා කරන නිර්නායක හතරක් නම්කරන්න. ලකුණු 05

(ආ) ඉහත නම්කළ එක් නිර්නායකයක් තෝරාගන නාගරික ප්‍රදේශයක් නිර්වචනය කිරීම සඳහා එහි වැදගත්කම නිදසුන් සමග විවේචනාත්මකව අගයන්න. ලකුණු 10

(ඇ) ගෝලීය නාගරීකරණ රටාවල නූතන ප්‍රවනතා සාකච්ඡා කරන්න ලකුණු 10

(8) පහත සඳහන් මාතෘකාවන්ගෙන් දෙකකට කෙටි සටහන් ලියන්න: ලකුණු12.5X2

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය.

(ආ) නැවත උත්පාදනය නොවන ස්වභාවික සම්පත්

(ඇ) සංවර්ධනය නිදහස ලෙස අර්ථදැක්වීම.

(ඈ) භුගෝලවිද්‍යාවේ එන ප්‍රාදේශීය සංකල්පය.